# සංක්ෂිප්තය

සාම්ප්‍රදායික වගාවක් ලෙස ග්‍රාමීය ජනතාව ඉතා දිගු කාලයක සිට වගා කරන ලද කහ සඳහා වෙළඳපොළ ඉහළ ඉල්ලුමක් පැවතීමත් සමග වාණිජ වගාවක් ලෙස එම වගාව කෙරෙහි යොමුවීමක් පවතී. කුළු බඩු වර්ගයක් වශයෙන් ආහාර නිෂ්පාදන කර්මාන්තය සඳහා ද, වර්ණකාරකයක් ලෙස ඇගළුම් නිෂ්පාදනය සඳහා ද බහුලව භාවිතා කරන කහ සඳහා දේශීය සහ විදේශීය වෙළෙඳපොළ තුළ ඉහළ ඉල්ලුමක් වාර්තා වේ. දේශීය වශයෙන් මෙම වගාව ව්‍යාප්ත කිරීම සඳහා මෙරට තුළ අවශ්‍ය සම්පත් හා විභවතාව නො අඩුව පවතී. මෙම අධ්‍යයනය තුළින් දේශීය කහ නිෂ්පාදන වියදම හා ආර්ථික ලාභදායීත්වය ගණනය කිරීම, ගෘහස්තව වාණිජ සහ අපනයන බෝග ලෙස කහ වගාව ව්‍යාප්ත කිරීම සඳහා පවතින නිෂ්පාදන සහ අලෙවිකරණ ගැටලු හඳුනාගැනීම හා සාර්ථකව ගෘහස්ථ වාණිජ බෝගයක් ලෙස කහ වගාව ප්‍රචලිත කිරීමට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීම මෙම අධ්‍යයනයේ අරමුණු වේ.

දැනට කහ වගා වපසරිය ඉහළ මට්ටමකින් පවතින කෑගල්ල, කුරුණෑගල හා මහනුවර යන දිස්ත්‍රික්කයන් හි ගොවිජන සේවා මධ්‍යස්ථාන 13කට අයත් වන පරිදි ගොවීන් 96 දෙනකු සහභාගි කර ගනිමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. බහු පියවර නියැදි ක්‍රමය අනුව, නියදිය තෝරාගත් අතර ගොවීන් වෙත ඉදිරිපත් කරන ලද විධිමත් ප්‍රශ්නාවලියක් මාර්ගයෙන්, පුද්ගල සම්මුඛ සාකච්ඡා, සිද්ධි අධ්‍යයනය (Case Study) මගින් හා යොමුගත ගොවි සාකච්ඡා (Focus group discussion) මගින් ප්‍රාථමික දත්ත රැස් කරන ලද අතර ද්විතික දත්ත සාහිත්‍ය විමර්ශන මගින් සහ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව වෙතින් ගත් දත්තවලට අමතරව හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ මේ ආශ්‍රිතව පවතින දත්ත භාවිතා කරන ලදී. මෙම අධ්‍යයනය සඳහා ක්ෂේත්‍ර තොරතුරු එක් රැස් කිරීම 2011 මාර්තු මස සිට 2011 ජුනි මස දක්වා සිදු කරන ලදී.

අධ්‍යයනයට බඳුන් වූ ගොවීන් කහ වගාවට යොමු වීමට මූලික වූ කරුණු ලෙස දක්වා ඇත්තේ අනෙකුත් බෝගවලට සාපේක්ෂව කහ වගාව සඳහා අඩු නිෂ්පාදන වියදමක් දැරීමට සිදු වීම ය. මෙය කෑගල්ල දිස්ත්‍රික්කයේ ගොවීන් 95%ගේ ද, මහනුවර දිස්ත්‍රික්කයේ ගොවීන් 90% ගේ ද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවීන් 79% ගේ ද මතය විය. මෙයට අමතරව, වෙළෙඳපොළ ඉහළ ඉල්ලුමක් පැවතීම සමඟ සාපේක්ෂව ඉහළ ආදායමක් ලබා ගත හැකි වීම, වගා නඩත්තු කටයුතු පහසුවීම යන ප්‍රධාන කරුණු කහ වගාවට ගොවීන් වැඩි වශයෙන් යොමු වීමට හේතු වී තිබේ.

බහුතර ගොවීන් සංඛ්‍යාවක් කහ වගාව සඳහා දේශීය බීජ ප්‍රභේද ඇතුලු ප්‍රභේද රැසක් භාවිතා කර ඇති අතර එක් එක් දිස්ත්‍රික්කයන්ගේ සාමාන්‍ය අස්වැන්න සැලකීමේ දී අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශ අගයට වඩා පහළ අගයක පැවතිණි. කෑගල්ල දිස්ත්‍රික්කයේ සාමාන්‍ය අස්වැන්න අක්කරයකට කිලෝග්‍රෑම් 2376ක් ද, මහනුවර දිස්ත්‍රික්කයේ සාමාන්‍ය අස්වැන්න අක්කරයකට කිලෝග්‍රෑම් 4140ක් ද වූ අතර කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ මෙම අගය කිලෝග්‍රෑම් 5071ක් ද විය.

අස්වනු අනුපාතය සැලකීමේ දී කෑගල්ල දිස්ත්‍රික්කයේ 1:10 ද, මහනුවර දිස්ත්‍රික්කයේ 1:13 ද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ 1:12 අගයක් විය. එසේ වුව ද, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිර්දේශ අනුව මෙම අගය 1:20 ක් ලෙස සඳහන් වේ.

කෑගල්ල දිස්ත්‍රික්කයේ බහුතර ගොවීන් සංඛ්‍යාවක් තමන්ට ලැබෙන සාමාන්‍ය අස්වැන්න පිළිබඳව සෑහීමකට පත් නොවූ අතර මෙසේ අස්වනු අඩුවීමට හේතු ලෙස එම දිස්ත්‍රික්කය තුළ ගොවීන් (81.8%) සඳහන් කරන ලද්දේ වගා කටයුතු සහ වගා පාලන කටයුතු නිසි ලෙස සිදු නො කිරීම ය.

ගොවීන් ලද අස්වැන්නේ අලෙවිය පිළිබඳ ගොවි ප්‍රතිචාර සැලකීමේ දී නියැදියේ ගොවීන්ගෙන් 73.9%ක් අමු කහ ලෙස අලෙවිය සිදු කරනු ලබයි. මෙයට අමතරව, ඇතැම් ගොවීන් අලෙවි ආකාර කිහිපයක් තෝරා ගෙන තිබුණි. ඒ අනුව, වියළි කහ ලෙස ගොවීන්ගෙන් 28.1%ක්, කුඩු ලෙස 12.5%ක් හා 2.1%ක් බීජ කහ ලෙස ද අලෙවි කොට ඇත. ගොවීන් බහුතරයක් නගරයේ පිහිටි කහ අලෙවි මධ්‍යස්ථානය තම අලෙවි මාර්ගය ලෙස තෝරා ගෙන තිබුණි. කහ ආශ්‍රිත නිෂ්පාදන සකස් කරන පිරිස සීමා සහිත වූ අතර එසේ යොමු නොවීමට හේතු ලෙස ඔවුන් සඳහන් කරන ලද්දේ ඒ සඳහා අවශ්‍ය ශිල්පීය හා තාක්ෂණික දැනුම නොමැති බව යි. අමුකහ සඳහා වෙළෙඳපොළ මිල සැලකීමේ දී පෙර වසර වලට සාපේක්ෂව ඉහළ අගයක් පැවතුනි. ඒ අනුව, කහ කිලෝග්‍රෑම් එකක් සඳහා දේශීය වෙළෙඳපොළ තුළ රු.54.50ක් වැනි සාමාන්‍ය අගයක් ද විදේශීය වෙළෙඳපොළ තුළ රු.300.00ක් වැනි සාමාන්‍ය අගයක් ද පැවතුනි.

මෙසේ දේශීයව වගා කළ හැකි බෝගයක් ආනයනය කිරීමට සිදුවීම කනගාටුදායක කරුණකි. එම නිසා දේශීය සම්පත් උපරිම ලෙස ඵලදායීතාවයෙන් යොදවා දේශීය අවශ්‍යතාව සපුරා ලමින් විදේශීය වෙළෙඳපොළ අවස්ථා ඇති කර ගනිමින්, රටේ ආර්ථිකය ගොඩනැගීමට යම් අයුරින් හෝ දායකවීමට කටයුතු කළ යුතු ය. මේ සඳහා කහ වගාව තවදුරටත් ගොවීන් අතර ප්‍රචලිත කළ යුතු අතර වගාවට යොදා ගන්නා ඉඩම් ප්‍රමාණය වැඩි කළ යුතු ය. ඊට අමතරව, ගොවීන්ට කහ ආශ්‍රිත නිෂ්පාදන සිදු කිරීමට අවශ්‍ය ශිල්පීය හා තාක්ෂණික දැනුම, පුහුණුව හා මගපෙන්වීම ද අදාළ ආයතන මගින් සපයා දිය යුතු ය.